
# පොකුණේ නැව හඳමාමා



P.G. සනුති චමිෂ්කා ගමගේ

කෘතියේ නම : පොකුණේ නෑව හඳමාමා

කතෘගේ නම : P.G. සනුති චමිෂ්කා ගමගේ

කතෘ අයිතිය ඇතුළු විස්තර:ISBN no: 978- 624-208-392-6

පිටකවර සිතුවම :P.G. සනුති චමිෂ්කා ගමගේ

7 ශ්‍රේණිය B

ශාන්ත තෝමස් බාලිකා විද්‍යාලය

මාතලේ.

පොත් පරිගණක සැකසුම: Y.M.S.K. අබේරත්න

නාඋල.

කතෘගේ වෙනත් කෘති: රහස

කෘතිය පළ කරන දිනය: 2025/02/08

# පිදුම

*කිරිත් එක්කම ජීවිතයද,*

*නිර්ලෝභිව පෙවූ*

***අම්මාට....***

*හිස මත නොදුටුවත් මිණි ඔටුනු*

*රජෙක් වගේ මට පෙනුන*

***තාත්තාට.....***

*පොතක වටිනාකම හඳුනන*

***කියවන්නට ආසා කරන හැමෝටම....***

*අලුත් පිටු සුවඳට, පිටු පෙරලෙන සද්දෙට*

***ආදරය කරන හැමෝටම....***

*පුස්තකාලය ඇතුලේ.......*

*පොත්කඩ ඇතුලේ..........*

***අතරමං වෙන්න ආස හැම දෙනාටම.....***

*ආදරයෙන් පුදමි.*

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"භෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

සඳුනි කියන්නේ දුප්පත් අහිංසක පුංචි ගැහැණු ළමයෙක්. දවසක් සඳුනිට එයාගේ මුළු ලෝකයම කළුවර වුණා වගේ දැනුනා. ඒ එයාගේ තාත්තා ගහකින් වැටිලා කොන්ද කැඩිලා එකතැන් වුණ දවසේ. එදා සඳුනි එයාගේ අම්මා එක්ක හොඳටම ඇඬුවා.



දවසක් සඳුනි එයාලගේ ගෙදර මිදුලේ ගල් තලාවක් මත වාඩි වෙලා රෑ අහස දිහා දුකින් බලා ගෙන හිටියා.

එදා අහස හරිම ලස්සනයි. රන් තැටියක් වගේ හඳ මාමා ලස්සනට පායලා. "අනේ, මටත් මේ හඳ වගේ වෙන්න ඇත්නම්" කියලා පුංචි සඳුනිගේ හිතට හිතුණා.

එතකොටම කවුදෝ සඳුනිට කතා කරනවා ඇහුණා. සඳුනි කලබලයෙන් වටපිට බැලුවා. ළඟ නම් කවුරුවත් හිටියේ නෑ. අහස උඩින් කතා කරනවා වගේ තමයි ඇහුණේ.

"සඳුනි, ඔයා හිතපු දේ මට ඇහුණා. ඒකයි මම ඔයාට කතා කළේ. "

හඳ මාමා කිවුවා. සඳුනිට හරි පුදුමයි !

හඳ මාමා සඳුනිට මෙහෙම කිවුවා.

"සඳුනි ඔයාටත් පුළුවන් මං වගේ වෙන්න. ඔයාලා කවුරුත් දන්නෙ නැති රහසක් අද ඔයාට මං කියන්න යන්නේ."



"ඔයා හොඳට මම කියන මේ කතාව අහගෙන ඉන්නකෝ."

එදා ඔන්න පෝය දවසක්. හඳ මාමා ලස්සනට කහපාට බෝලයක් වගේ අහසේ බැබළෙමින් හිටියා. තරු පොකුරු හඳ මාමාගේ වටේට ඉඳගෙන හිනා වෙවී පහත බලන් හිටියා.

හඳ එළිය වැටිලා පොළොව හරිම ලස්සනයි. රැයක් වුණාට කිසිම කළුවර ගතියක් අහලකවත් නෑ. ගස්වැල්, මල්, කණාමැදිරි, බකමූණු මේ ඔක්කොමලා ඉන්නේ හරිම සතුටින්. හඳ එළියේ ලස්සනට මේ හැමෝම වශීවෙලා වගේ අහස දිහා බලාගෙන ඉන්නවා.

මෙහෙම ඉන්නකොට හඳමාමා දැක්කා ලස්සන පොකුණක්. ඒකේ වතුර හඳ එළියට ලස්සනට දිලිසෙනවා.ඒ වතුර අස්සෙන් හඳමාමාට පේන්න ගත්තා ඒයාගේ ලස්සන රූපේ



“හප්පේ, කාටද ඉතින් ඒ වගේ ලස්සන රූපයක් තියෙන කොට ආඩම්බර.” හඳ මාමා ආඩම්බරයෙන් හිනා වෙලා පොකුණෙන් ඒයාගේ හැඩ බල බල ඉන්න කොට හරි අපූරු අදහසක් ආවා.


“මේ පොකුණේ වතුර හරිම සීතලට, සනීපෙට ඇති. අනේ මට මේ වතුරෙන් නා ගන්න ඇත්නම්.”

කියළා ඒයාට හිතුණා.මම අහසට වෙලා ඉන්නවා මිසක් කවදාවත් නාන්නේ නැහැනේ. නැවොත් මාව තවත් හැඩට පෙනෙයි. හඳ මාමාට හිතුණා. එයා මේ ගැන තරු වලට කිවුවා.

“අපොයි හඳ මාමේ, මේ රෑ පොකුණේ බැහැලා නැවොත් හෙම්බිරිස්සාව හැදෙයි. අමාරු උනොත් උණ ගන්නත් බැරි නැ...මොකද හඳ මාමාට නාලා පුරුදුත් නෑහැනේ.”

තරු හනිකට හඳ මාමාට නෑවොත් වෙන දේ තේරුම් කරලා දුන්නා. අනේ ඒත් හඳ මාමාගේ හිත වෙනස් උනේ නෑ. එයාට ඕනේ වුණේ පොකුණේ බැහැලා නා ගන්නමයි.

අන්තිමට තරු පොඩ්ඩක් එහෙ මෙහෙ වෙනකන් ඉදලා පහළට බැහැගත්ත හඳමාමා පොකුණට පැන්නා.



පොකුණේ සීතල වතුර හොඳට නා ගත්තා.

"හම්මේ දැනෙන සනීපේ..." හඳමාමාට හිතුණා. පොකුණේ නාපු හඳමාමා කවුරුත් දකින්න කලින්


ඔළුව අතින් පිහ පිහ ඉක්මනට අහසට නැග ගත්තා. නැගලා, පුරුදු විදිහට හිනාවෙවී හිටියා.



ටික වෙලාවක් යනකොට හඳ මාමාට වෙනසක් දැනුනා. මගේ කටහඬ පොඩ්ඩක් වෙනස් වීගෙන එනවා වගේ, ඔළුවත් බරයි.

"හචින්, හචින් " මහ සද්දෙට හචිනුත් යනවා. මොකද්ද මේ මට වේගෙන එන්නේ. හඳ මාමාට බය හිතුණා. ටික ටික ඇඟ සීතල කරලා අමාරු ගතිය වැඩි වුණා.

බැරිම තැන හඳමාමා පහළට බැහැලා පොකුණෙන් හොරෙන් නාපු එක ගැන විස්තරේ තරු වලට කිවුවා.



"ආනේ අපොයි..! හඳමාමේ මොනවද මේ කර ගත්තේ. දැන් ඉතින් වෙද ගෙදර යන්නත් වෙයි. නැතුව මේක සනීප වෙන් නෑ. " තරු පොකුරු බය වෙලා හඳමාමාව උස්සගෙන වෙදගෙදර දිවුවා.

වෙද ගෙදර තියෙන්නේ ලොකුම ලොකු සුදු වලාකුලක් ඇතුලේ. වලාකුළු වෙද ගෙදර වෙද සීයා හඳමාමාට මාසයකට තිත්ත බෙහෙත් නියම කළා.



"හරියට වෙලාවට බෙහෙත් ටික බොන්න ඕනේ. මුලදි මුලදි තිත්ත බෙහෙත් බොනකොට ලෙඩේ ටිකක් වැඩි වෙනවා වගේ පෙනෙයි. ඇගේ තියෙන ලස්සනත් අඩු වෙනවා වගේ පෙනෙයි. ඒක හිතට ගන්නේ නැතුව එක දිගට තිත්ත බෙහෙත් බොන්න ඕනේ. හරිද හඳමාමේ..? එතකොට තමයි ඔය ලෙඩේ හරියටම සනීප වෙන්නේ."

වෙද සීයා උපදෙස් පත්තරයක්ම දුන්නා. හඳමාමා ඔක්කෝටම හා කියලා තරුත් එක්ක අමාරුවෙන් ගෙදර ආවා.

වෙද සීයා කිවුවා වගේම බෙහෙත් බොනකොට හඳ මාමට ගොඩක් අමාරු වුණා. හඳ මාමාගේ ලස්සනත් ටික ටික අඩු වුණා. පෙනුමත් ටික ටික වෙනස් වුණා. ලස්සනට රවුමට හිටපු හඳමාමා පොඩි වකයක් වගේ වෙලා අන්තිමට පෙන්නේ නැතුවම ගියා.

ඒ දවස් වල හඳමාමා පොළොවට පේන්න අහසට ආවේ නෑ. ඇඳට වෙලාම හිටියා.




දවස් පහළොවක් විතර යනකොට හඳ මාමාව සනීප වෙන්න පටන් ගත්තා. ටික ටික මූණට එළිය වැටෙන්න පටන් ගත්තා. වකයක් වෙලා තිබුණ ඇඟ ටික ටික රවුම් වෙන්න පටන් ගත්තා. හඳ

මාමට ටික ටික සනීප වේගෙන එනවා වගේ. හඳ මාමාට හරිම සතුටුයි.

හඳමාමා තව තවත් උනන්දුවෙන් බෙහෙත් බිවුවා. තව දවස් පහළොවක් ගෙවිලා ගියා. ඊලග පෝය වෙනකොට හඳ මාමාට හොඳටම හොඳයි. වෙනදට වඩා මුහුණ එළිය වැටිලා හරිම ලස්සනයි. හඳමාමා ආපහු තරු වටකරන් අහසට ඇවිල්ලා බොහෝම ලස්සනට හිනා වුණා.

හිනා වී ගෙනම පොළවට එළිය බෙදලා දෙන්න පටන් ගත්තා. හැමෝටම හරිම සතුටුයි.

ඇයි දන්නවද..? හඳමාමා ආපහු අහසට ඇවිල්ලානේ. හඳමාමා නැතුව පාළුවෙන් හිටිය හැමෝටම හරිම සතුටුයි. ඒත් දන්නවද..? පොඩි රහසක් තියෙනවා. පෝය දාට හඳ එළියට දිලිසෙන පොකුණක් දැක්ක ගමන් හඳමාමාට අර ඔක්කෝම අමතක වෙනවා. ඉතින් කලින් වගේම පොකුණට පැනලා නානවා. නාලා ලෙඩ වෙලා ආපහු මාසයක්ම බෙහෙත් බොනවා. පෝයට තමයි සනීප වෙන්නේ.



ඔන්න ඔහොම තමයි අපි පෝයදාට දකින හඳමාමා ඊට සස්සේ ටික ටික පුංචි වකයක් වෙලා නෙපෙනි යන්නේ. ආයෙමත් ටික ටික ලොකු වෙලා ලස්සනට පේන්නේ.

හඳමාමාගේ මේ රහස දැනගෙන හිටියේ පොළවේ තිබුණු ලස්සන පොකුණ විතරයි.

දැන් පුංචි සඳුනිත් එක්ක ඔන්න ඔයාලත් දන්නවා. මීට පස්සේ අහස දිහා බලන කොට පොකුණේ නාපු හඳ මාමාගේ  වෙනස් වීම ඔයාලටත් පෙනේවී.

සඳුනි හඳ මාමාගේ ඒ කතාව අහලා සතුටු වුනා.



එයා එයාගේ ජිවිතයට වුණා කරදර බාධක අමතක කරලා. ජීවිතය ගැන අලුතින් හිතන්න පටන් ගත්තා. එදා ඉදලා සඳුනි මහන්සි වෙලා පාඩම් කරලා හොඳින් ඉගෙන ගත්තා.


මොකද සඳුනි දන්නවා හොඳින් ඉගෙන ගෙන දවසක පුන්සඳ වගේ මුළු ලෝකයටම එළිය දෙන්න පුළුවන් කියලා.

"පුංචි අපිත් අපේ ජිවීත වලට මොන තරම් කරදර බාධක ආවත් ඒවා සඳ වගේ ජයගෙන මුළු ලෝකයටම එළිය දෙන පුන් සඳක් වෙමු..."

නිමි.

# පුංචි අපට දැනුම් පොදක්

## සඳේ අවස්ථා (චන්ද්‍ර කලා)



**පසළොස්වක සඳ බබළයි**

**අව අටවක වම දිදුලයි**

**අමාවකට සඳ නිදියයි**

**පුර අටවක දකුණ හැඩයි**



## P.G. සනුති චමිෂ්කා ගමගේ
## 7 ශ්‍රේණිය B
## ශාන්ත තෝමස් බාලිකා විද්‍යාලය
## මාතලේ

### පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්